# ගොයම් කවි ශතකය හෙවත්
# අභිනව ගොයම් මාලය

(පැදි 100 කින් යුත් මෙම කාව්‍යයේ පළමු සහ දෙවන කොටස පසුගිය කලාපවල පලවිය. මේ තවත් කොටසකි)

අටබාගේ උඩගම "පුලස්ති" හි ජේ. එච්. එම්. මාරසිංහ විසිනි

## හිරුගේ ගමන

ජීවය ලෝකෙට දෙන හිරු දෙවියන්
වඩිනා මං යුවලක් ඇත දනගන්
උතුරු අයන හා දකුණු අයන යන්
දළු-මල්-පල-අල වැඩෙණා සමයන්

සිසිර වසන්තය හා ගිම්හානය
උතුරු අයන හිරු දිවිගෙ මැඩිමය
වස්සානය-සරද හේමන්ත ය
දකුණු අයන හිරුගේ නිර්මා නය

ඇහැල මහේ හිරු දකුණ බලනවා
එදෙසට හමසක් ගමන් කරනවා
ඊසානෙන් තද හුලං හමනවා
බෙංගාලේ මුහුඳෙන් වැහිඑනවා

බිහරය හා වප් ඉල් තුන්මාසය
මාස් කන්නයට ගොවිතැන් සුදුසුය
උඩරට දිය උල්පත් සරුසාරය
කෙත්වත් කොළ පැහැයෙන් බැබලේමය

උඳුවප් මස හිරු උතුර බලනවා
නිරිත දිගෙන් වැහි වළා නැගෙනවා
දකුණු සාගරෙන් වැස්ස ලැබෙනවා
පහත රටේ කෙත්වත් සරු වෙනවා

නවම්-මැදින්-බක් යන තුන්මාසය
යල් මෝසම මේ දනගන් නියැනය
පොසොන් මහේ වැසි පල බෝවේමය
නවකම්-ගොවිකම්-වේ සරුසාරය

## ගොවිකම් ඇරඹීමේ චාරිත්‍ර විධි

බලා නැකැත්, සුබහෝරා සුබ දවස
වෙලා පේව ඉටුදෙවී වැඳ සිරිත් ලෙස
ලොලා සකුරු කිරිබත් වළඳා සතොස
දූලා සිතින් අළුයම තම කෙතට බැස

## දික්පතින් පිදීම

කෙත මැද තැනක් සැස ගොමගා සකස් කොට
නව ගැබ් යතුර ඇඳ-වැඳ ගැබ මීහිකතට
කැවිලි බත් බුලත් දුම් මල් සකස්කොට
පතිහු අවදිගේ බැතියෙන් පුදසිට

## නව ග්‍රහ පූජා

කොකුමන් පාට බත් නිකුළුත් සකස් කොට
පුදක් ඉඹුල් පත්පිට ඉඳුරේ රවිට
කිරෙන් පිසූ බත් කොල දිවුල් තටු පිට
පුදත් පහන් හා වයෙඹි සඳු දෙවිට

රන්බත් ගිතෙල් සකුරුත් හා කොළොම් පතේ
රත්ගත් හට දකුණු දිග පුදදෙන් සතොසේ
සොම්පුත් සකුරු වෙඩරුක් බත් කොහොඹ පතේ
පිදුවොත් උතුරු ගැබ ගොවියට වේය සෙසේ

ගුරුට කසාවන් බත් ඉසත බෝපතේ
කිවිට හීනිකොතන් සුදු බත් කරඳ පතේ
ශනිට කුණු මසුත් නිල් බත් එනුය පතේ
වරුන පුදකරන් ගොවියට වේය සෙතේ

## නිමිති

මෙලෙසින් සුදු පශසකට වී සිටින විට
කපුටන් එසුද ගෙනගියහොත් සිවු දිගට
දැනගන් පෙර නිමිති කෙත සරුවන බවට
ගියෙනන් අපලවේ කපුටන් අනු දිගට

මෙලෙසින් සුබාසුබ දැනගෙන නිමිති මගින්
යොදමින් නැකැත් සතරෙහි විදි අපල හරින්
දිරියෙන් යුතුව කෙත සරුකරනට නොලෙසින්
ගොවිකම සතරෙ විදියොදලා පලය ලබන්

## සී සෑම

දක්ඛිනි තරුණ ගොන් බානක් නගුලෙ බැඳා
දක්ෂනු අඩහැරක් පා පෙරදිගට යොදා
එක්තැන හෝ පසක් හී විටි මෙමලස යොදා
දක්ෂනු උතුරු දිගටත් හී විටි එලෙදා

ඉන්පසු ගොන් මුදා නවතා හී එදින
සන්තොසයෙන් ගොසින් කිරිබත් වළඳ මීන
ගෙන් කිසිවක් එද පිටකට නොම දෙමින
සත්සුන් සිතින් තනිවම හිදිනේ එදින

## නගුල බිඳීම

වියදඬු බිඳුම කමහට සැටවත අඹුට
ගැටලනු පුතුට හීවැල නෑ දියණියට
ගොන්පස බිඳුම හෝ ආවුද බිඳුන විට
වෙන්නෙය තැවුල් අවුලක් පවුලේ සැමට

## වැට බැඳීම

අස්විද, බෙරනය, ඈ පස් නැකත ට
කැප්පෙටියා ලී සතරින් පුර වැට
බැමමට ගනු නාඹිරිත්ත වැල් පට
සත්කුල නොවදී මස ඉන් ඇතුළ ට

අද, පුන, පුස, අස්ලිස, මා නැකත ට
යොදු කෝන් ඉනි සතරින් පුර වැට
බඳිනට වේවැල් ගනු මාවරය ට
වද නොමද සිවුපා බැන්දොත් මින් වැට

පුවපල්, තුරුපල්, ඈ පස් නැකත ට
ගෙන වැල් හීරුස් වරා කෝටු වැට
වනසත් කැල ඉන් නොවදී ඇතුළ ට
රැකදෙන් ගොවිතැණ් නොයෙ පාළුව ට

" අතිගරු ජේ. ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා ශ්‍රී ලංකාවේ විද්‍යාභිවර්ධන සංගමයේ, 42 වන සැසිවාරය විවෘත කිරිමේ උත්සවය අමතමින්...........

කෘෂිකර්ම ක්ෂේත්‍රය අතින් බලන කල නව භෝග වගාවන් සහ සූක්ෂම වගාව උදෙසා විශාල බිම් ප්‍රමාණයක් තිබෙනු ඇත. අප සහලින් ස්වයංපෝෂිතය. මෙය අවුරුදු 450 කට පසු ලඟාකරගත් ඉලක්කයකි. මෙම ප්‍රතිඵල වලින් අප තෘප්තිමත්ම සිටියදී, වර්ෂ 2000 දී ශ්‍රී ලංකාවේ ජිවත්වන දෙකෝටි දශ ලක්ෂයක් වන ජනතාව උදෙසා පෝෂ්‍යදායි කම අතින් උසස් ආහාරයක් සළසාදීම විද්‍යාඥයන්ගෙන් අප බලාපොරොත්තු වෙමු.

සහල් පමණක් සපයාදීම ප්‍රමාණවත් නොවේ. විවිධාංගීකරණය කොට මාංශ ජනක ධාතු අපේ ජනතාවට ලබාදිය යුතුයි. පෝෂ්‍යයට අදල ගැටළු විසදීම අපේ ව්‍යායාමයේ පරමාර්ථය විය යුතුයි. මේ අතින් දඹල වගාකිරීම සහ පාවිච්චිය අපේ එක් ප්‍රයත්නයකි.

ශ්‍රී ලංකාව අනිකුත් රටවල් සඳහා වෙළඳ උයනක් කිරීමට අපේක්ෂා කිරීම යුක්ති සහගතය. අපට ආසියාවේ "පළතුරු කූඩය" විය හැකිය. විවිධාංගීකරණය කරන ලද කෘෂිකර්මය මගින් අපේ ජනතාවටත් – අපනයන වෙළඳ පොළටත් පළතුරු සැපයීමට අපට හැකිවිය යුතුය..........."

(1986 දෙසැම්බර් මස 10 වෙනි දින දිණමිණ)